සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 08 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 50 S |
|---|---|---|

**නාට්‍ය හා රංග කලාව** — කාලය පැය දෙකයි

නම / අංකය :

සැලකිය යුතුයි :- • සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

## I කොටස

01 සිට 04 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු උපයෝගී කර ගන්න.

A - වෙදා නටන්නේ පළමුව සබේට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙව්ලන්නේ

B - සිරසටා ගෙතූ මල් වඩම්
හිස මතුපිටා දිලි තෛලයෙන්

C - ඉදින් බබෝ ඉදින් - මගේ අතේ ඉදින්
බොහෝ ආදරෙන් නුඹේ මව මෙන් - රකින්නෙමි මෙමං

D - සෝබාවදේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුරු මඟ පිය කරු වූ..........

01. ඉහත ගීත කොටස් අතුරින් සොකරි ජන නාට්‍යයට අදාල ගීතය ඇතුළත් අක්ෂරය වනුයේ,
i. A ය ii. B ය iii. C ය iv. D ය

02. B අක්ෂරයට අදාල ගීත ඛණ්ඩය කුමන නාට්‍ය විශේෂයකට අදාල වේද?
i. සොකරි නාට්‍ය ii. කෝළම් නාට්‍ය iii. නාඩගම් නාට්‍ය iv. නව නාට්‍ය

03. D අක්ෂරයේ ගීත ඛණ්ඩය ඇතුළත් නාට්‍ය වනුයේ,
i. නරිබෑනා නාට්‍ය ii. මනමේ නාට්‍ය iii. රාජ කපුරු නාට්‍ය iv. තාරාවෝ ඉගිලෙති නාට්‍ය

04. ඉහත ගීත අතුරින් බැලසන්න නාඩගමේ ගීත ඛණ්ඩය අයත් අක්ෂරය වනුයේ,
i. A ය ii. B ය iii. C ය iv. D ය

05. නාට්‍යක නාට්‍යෝචිත අවස්ථාවක් ලෙස හඳුන්වනු ලබන්නේ,
i. නාට්‍යයකට උචිත අවස්ථාවකි
ii. ප්‍රේක්ෂකයා නොමග යවන අවස්ථාවකි
iii. ප්‍රේක්ෂකයා තුළ කුතුහලය දෙගිඩියාව ඇති කරවන අවස්ථාවකි
iv. ඉතා කලබල කාරී වූ අවස්ථාවකි

06. නාට්‍ය පෙළක අඩංගු අංගයක් නොවන්නේ,
i. රංග විධාන ii. ගීත කොටස් හා සංවාද iii. චරිත iv. කතාවේ මුල මැද අග පිළිවෙලින් ගැලපීම





07. ඉහත ඡායාරූප දෙකෙහි දැකගත හැකි වේෂ භූෂණ වනුයේ,
i. සේලය, හැට්ටය, ජෝතිය, මේවර
ii. සේලය, ජෝතිය, කඩුව, සිංහාසනය
iii. මාල වළලු, හැට්ටය, ජෝතිය, මිරිවැඩි සඟල
iv. හිස් පළඳනාව, සිංහාසනය, සේලය, ඉන හැඩය

08. ආංගික අභිනයේ ප්‍රධාන ප්‍රභේද වන්නේ,
i. හිස, කඳ, ගාත්‍රා
ii. අංග, ප්‍රත්‍යාංග, උපාංග
iii. දෙව්ර, පිට කොන්ද, කකුල්
iv. වාචික, සාත්වික, ආහාර්ය

09. නාට්‍ය නම් බීජය මුල් වරට පිළිසිඳ ගනු ලබන්නේ කාගේ මනසෙහිද?

i. නාට්‍ය පෙළ රචකයාගේ මනසෙහිය
ii. නාට්‍ය අධ්‍යක්ෂකවරයාගේ මනසෙහිය
iii. නළුවාගේ මනසෙහිය
iv. ප්‍රේක්ෂකයාගේ මනසෙහිය

10. නාට්‍යයක් සඳහා නළු නිළියන් තෝරා පත්කර ගැනීම හඳුන්වනුයේ,

i. සමාරෝපය ලෙසය. ii. අනුකරණය ලෙසය. iii. නළුවරණය ලෙසය. iv. ක්ෂණික නිරූපණය ලෙසය.

11. කතාන්දරයක ලක්ෂණයක් **නොවන්නේ** පහත සඳහන් ලක්‍ෂණ වලින් කුමක්ද?

i. අසා රස විඳීමට ඇති නිර්මාණයකි.
ii. ශ්‍රාවකයෙක් හා කථිකයෙක් සිටී.
iii. මුඛ පරම්පරාවෙන් පරම්පරාවට පැවත ගෙන එයි.
iv. ලිඛිත පිටපතක් ඇත.

12. නළුවෙකුට රංග අභ්‍යාස වැදගත් වනුයේ,

i. ශරීරය සිහින් කර ගැනීමටය
ii. දක්‍ෂ රංගන ශිල්පියෙකු වීමටය
iii. කඩවසම් වීමටය
iv. නිරෝගී වීමටය

13. චුල්ල ධනුද්ධර ජාතක කතාව ඇසුරින් නිර්මාණය වූ නාට්‍යක් වනුයේ,

i. මනමේ නාට්‍ය ii. සිංහබාහු නාට්‍ය iii. සඳකිඳුරු නාට්‍ය iv. කදාවළලු නාට්‍ය

14. නළුවෙකු විසින් ගයනු ලබන ගීත අයත් අභිනය වනුයේ,

i. ආංගික ii. වාචික iii. සාත්වික iv. ආහාර්ය

15. නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

i. නළු නිළියන් විසිනි ii. රචකයා විසිනි iii. අධ්‍යක්ෂක විසිනි iv. අර්ථපති විසිනි

16. ශරීරයේ සැහැල්ලු බව ඇති කර ගැනීමට කරනු ලබන රංග අභ්‍යාස වන්නේ,

i. ශිථිලකරණ අභ්‍යාස ii. සංවේදන අභ්‍යාස iii. දර්පණ අභ්‍යාස iv. තාපන අභ්‍යාස

17. නළුවෙකු චරිතයට ප්‍රවේශ වීම හඳුන්වනු ලබන්නේ,

i. සමාරෝපය ලෙසිනි ii. අනුකරණය ලෙසිනි iii. අභිරූපණය ලෙසිනි iv. රූපණය ලෙසිනි

18. ළමා නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු වන්නේ,

i. රංජිත් ධර්මකීර්ති මහතා
ii. මැණිකේ අත්තනායක මිය
iii. සෝමලතා සුබසිංහ මිය
iv. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

**19-20ප්‍රශ්න වලට නොගැලපෙන පිළිතුර තෝරන්න.**

19. i. අංග රචනය ii. වේෂභූෂණය iii. රූපණය iv. රංග භාණ්ඩ

20 i. ප්‍රවේශ වීම ii. ප්‍රවිශ්ඨ වීම iii. අනුගත වීම iv. ආරූඪ වීම

## කොටස - II

**පළමු ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න 02කට පිළිතුරු සපයන්න.**

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු වලහා හා මාෂා නාට්‍ය ඇසුරින් සපයන්න.

01. i. වලහා සහ මාෂා නාට්‍යයේ ඔබ සිත්ගත් හා හාස්‍යෝත්පාදක අවස්ථාවක් ලියන්න. ( ල. 2 )

ii. මෙම නාට්‍යයෙන් ඔබ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ 02ක් ලියන්න. ( ල. 2 )

iii. වලහා සහ මාෂා යන ප්‍රධාන චරිත දෙක මුහුණ දෙන ප්‍රධාන සිදුවීම් 02ක් ලියන්න. ( ල. 2 )

iv. මෙම නාට්‍යයේ ඔබ සිත්ගත් ගීත කොටසක් ලියන්න. ( ල. 2 )

v. මෙම නාට්‍යයේ එන වැඩිහිටි චරිතය නම් කර එම චරිතයෙන් ලබාගත හැකි ආදර්ශයක් ලියන්න. ( ල. 2 )

02 .i. ආගමික කතාවක් යනු කුමක්ද? ( ල. 2 )

ii. බෞද්ධාගමික කතා ඇසුරින් නිෂ්පාදිත නාට්‍ය 02ක් හා අන්‍ය ආගමික කතා ඇසුරින් නිෂ්පාදිත නාට්‍ය 02ක් ලියන්න. ( ල. 3 )

iii. තෝරා ගන්නා ලද ආගමික කතාව රංගයක් බවට පත් කිරීමේදී කළ යුතු පියවර 05ක් ලියන්න. ( ල. 5 )

03. i. අභිරූපණ රංගයක් යනු කුමක්ද? ( ල. 2 )

ii. අභිරූපණ කලාව තුල නළුවා භාවිතයට ගන්නා ප්‍රධාන අභිනයක් හා වේදිකා නාට්‍යයකදී නළුවා භාවිතයට ගන්නා ප්‍රධාන අභිනයක් පහත පරිදි වගුවක වෙන වෙනම ලියන්න.

| අභිරූපණ නළුවා රංගනය සඳහා යොදා ගන්නා අභිනයන් | වේදිකා නාට්‍ය නළුවා රංගනයට යොදා ගන්නා ප්‍රධාන අභිනයන් |
|---|---|
| | |

iii. අභිරූපණ ශිල්පියෙකු වෙස් ගන්වන ආකාරය කෙටියෙන් ලියා ඔබ වෙස් ගැන්වූ එම ශිල්පියාගේ මුහුණ ඇඳ වර්ණ ගන්වන්න. ( ල.5 )

04. i. ප්‍රධාන අංග රචනා ක්‍රම 02ක් ලියන්න. ( ල. 2 )

ii. අංග රචනා ද්‍රව්‍ය 06ක් ලියන්න. ( ල. 3 )

iii. අංග රචනයන් සිදු කරන ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු 04ක් ලියන්න. ( ල. 5 )

05. i. ඔබ දන්නා රංග ක්‍රීඩා 02ක් නම් කරන්න. ( ල. 2 )

ii. රංග ක්‍රීඩා කිරීම තුළින් නළුවාට ලැබෙන ප්‍රයෝජන 04ක් ලියන්න. ( ල. 3 )

iii. ඔබ දන්නා රංග ක්‍රීඩාවක් සිදු කරන ආකාරය ලියා දක්වන්න.

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

## 08 ශ්‍රේණිය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | i | 11 | iv |
| 02 | ii | 12 | ii |
| 03 | iv | 13 | i |
| 04 | iii | 14 | ii |
| 05 | iii | 15 | iii |
| 06 | iv | 16 | i |
| 07 | i | 17 | i |
| 08 | ii | 18 | iii |
| 09 | i | 19 | iii |
| 10 | iii | 20 | iv |

- සියළුම ඇගයීම් සඳහා සිසුන් ඉදිරිපත් විය යුතුය

නාට්‍ය හා රංග කලාව 2019

8 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය

ප්‍රායෝගික පරීක්ෂණය

**ගුරුභවතුන් සඳහා පමණි**

**01 ඇගයීම**

ඔබ කැමති නාඩගම්, නූර්ති හෝ නව නාට්‍ය ගීතයක් ගායනය රංගනය මගින් ඉදිරිපත් කිරීම

සැ.යු - සම්පූර්ණයෙන් ගීතය ගැයීම හා රංගනය කල යුතුය

- අංග චලන හා භාව ප්‍රකාශන සහිතව ඉදිරිපත් කළ යුතුය ( ල . 10 )

**02 ඇගයීම**

වළහා සහ මාෂා නාට්‍යයේ සිසුවාට කැමති ස්ථානයක් තෝරාගෙන ඒකල භාෂණයක් ඉදිරිපත් කිරීම

සැ.යු - සෙසු චරිත පිළිබඳ අවබෝධය තිබීම

- කාලය විනාඩි 02 පමණ රංගනය කිරීම ( ල . 10 )

**03 ඇගයීම**

ජන කතාවක, සුරංගනා කතාවක් හෝ සිසුවා කැමති ඕනෑම කතාන්දරයක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම

සැ.යු - චරිත එකිනෙක කතාව තුලින් මතු විය යුතුය

- කතා කරුවෙකු සිටිය යුතුය
- අවශ්‍යනම් සරළ රංග භාණ්ඩ, වේෂභූෂණ යොදා ගත හැකිය
- කාලය විනාඩි 3 -5 ක් විය යුතුය ( ල . 10 )

**04 ඇගයීම**

පහත සඳහන් මාතෘකා වලින් එකක් කුසපත් ඇදීමක් මගින් තෝරා දී ක්ෂණික චරිත නිරූපණයක් සිදු කිරීම.

01. තීන්ත බාල්දියක් ඇග වැටී වර්ණවත් වූ නරියෙකු ගගක් අසලට ගොස්...
02. බොරු ගොතමින් කියා සිගමන් යදින උපාසිකාවක්..
03. මාළු කපා විකුණන මාළු වෙළෙන්දෙකුට මාළු කපන විට මාළුවාගේ බඩේ රත්‍රන් මුද්දක් හමුවීම.
04. කම්මැලිකමේ නිදා සිටින පූසරාළට උසුළු විසුළු කරන මී රාළ කෙනෙකුගෙන් කරදර පැමිණීම.
05. වසර ගණනාවකට විදෙස්ගතව සිටි තම මව නිවසට පැමිණේ...

සැ.යු - මාතෘකාවට හානි නොවී අග කොටස වෙනස් කර සිසුන්ට ලබා දෙන්න.

- කාලය වි. 3 -5 විය යුතුය ( ල . 10 )

**05 ඇගයීම**

නිදහස් තේමාවක් උපයෝගි කර ගනිමින් කණ්ඩායම් සාමූහික රංගනයක් ඉදිරිපත් කිරීම

සැ.යු - කණ්ඩායමට සිසුන් 5 - 7 විය යුතුයි.

- පිටපතක් රචනා කර ගත යුතුයි.
- අනුශාංගික අංග ගැලපෙන ලෙස යොදා ගත යුතුයි.
- කණ්ඩායමේ සියළුම දෙනා රංගනය සඳහා සහභාගී විය යුතුය. ( ල . 10 )